පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : : **චිත්‍ර කලාව**

සතිය : තෙවන සතිය

ශ්‍රේණිය :6

සකස් කිරීම : : D.P.එපිටවත්ත මිය

මාවනැල්ල අධ්‍යාපන කලාපය

- නිපුණතා මට්ටම 6.1 : තෝරා ගත් ආගමික හා ජාතික උත්සව අවස්ථාවන් හි දක්නට ලැබෙන කලාත්මක අංග රසාස්වාදය කරයි.
- ක්‍රියාකාරකම 6.1.4 : ''නත්තල් උත්සවය හා බැඳි නිර්මාණ අගයමු.'' ආගමික වතාවත්
- කාලච්ඡේද සංඛ්‍යාව : 01 යි
- සපයාගතයුතු ද්‍රව්‍යයන් :නත්තල් සීයාගේ පින්තූරයක්නත්තල් සුබ පැතුම් පතක්

ගව ලෙනක පින්තූරයක්

- පහත කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කරන්න

## නත්තල් උත්සවය

- "නතාල" නැමති පෘතුගීසි වචනයෙන් බිඳි ආ නත්තල යන වචනයෙන් " උපත" යන අර්ථය ලබා දේ.
- ලතින් භාෂාවෙන් ද "නතාලිස්" යන්නෙහි අර්ථය "උපත " වේ.
- ලෝකය පුරා විසිරී සිටින ක්‍රිස්තියානි බැතිමත්හු ජේසු බිළිඳාගේ උපත් දින නත්තල ලෙසින් උත්සවාකාරයෙන් සමරති.
- ජේසුස් වහන්සේ යනු මනුෂ්‍යත්වය ලබාගත් දේව පුත්‍රයා වේ.
- නත්තල් උත්සවයේදී සමරනු ලබන්නේ ජේසුස් වහනසේගේ මෙම මනුෂ්‍යයකු ලෙස ඉපදීමයි.
- ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් ලෙස සලකනු ලැබේ.
- ජේසුතුමාගේ මව මරියතුමිය වන අතර උන්වහන්සේ සුරැකි පියා ජුසේතුමාණන් වේ.
- දෙසැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රියේ ජේසු කුමරුන් උපත් බවට පිළිගැනේ.
- ජන සංගණනයකට සහභාගි වීම සඳහා "බෙත්ලෙහෙමට" පැමිණි අවස්ථාවේ ගවලෙනක් තුළ දී ජේසු බිළිඳාගේ උත්පත්තිය සිදු වූ බව පිළිගැනේ.
- ක්‍රිස්තුස් වහන්සේ විසින් සිදුකරනු ලැබූ දේශනා හා උන්වහන්සේගේ ප්‍රාතිහාර්යයක් ද සබත් දිනය නීති රීති කැඩීම හේතුකොටගෙන ජුදා නායකයින් උන්වහන්සේට විරුද්ධව නැගී සිටියෝ ය.

- එම හේතුන් මුලකොටගෙන උන්වහන්සේ කුරුසියේ එල්ලා මරා දැමූහ.
- සෑම වසරකම දෙසැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රියේ ද දේවස්ථානයට රැස්වන කිතුනබැතිමත්හු නත්තල හෙවත් ජේසු උපත උත්සවාකාරයෙන් පවත්වයි.
- එදින දුගී ජනතාවට ආහාරපාන, ඇඳුම් පැලඳුම් දීම මෙන් ම තෑගි බෝග බෙදා දීම ද සිදු කරනු ලබයි.
- කිතුනු බැතිමත්හු නත්තලට දින ගණනාවකට පෙර එම මංගල්‍යයට සැරසෙන අතර දේවස්ථානය හා නිවෙස් සැරසීම, ගවලෙන් සෑදීම හා නත්තල් ගස් අලංකරණය කිරීම ආදිය සිදුකරනු ලබති.
- එදින අලුත් ඇඳුම් පැලඳුම්වලින් සැරසීම මෙන් ම ප්‍රනීත ආහාරපාන පිළියෙල කිරීම ද ඔවුන්ගේ චාරිත්‍රයක් වේ.
- නත්තල් සුබපැතුම්පත් හුවමාරු කර ගැනීම විශේෂ සිද්ධියක්වන අතර නත්තල් සීයා කුඩා දරුවන්ගේ ප්‍රියජනක බලාපොරොත්තුවක් වේ.
- නත්තල් කැරොල් ගී, නත්තල් නාට්‍ය හා නත්තල ආශ්‍රිත චිත්‍රපට දර්ශන මෙම උත්සව කාලයේ දක්නට ලැබෙන විශේෂාංග වෙයි.
- දුප්පතුන් සඳහා දාන මාන දීම මෙන් ම කුඩා දරුවන් වෙනුවෙන් තෑගි බෝග හා ඇඳුම් පැලඳුම් බෙදා දීම ද නත්තල් දිනයේ දී පවත්නා සුවිශේෂ චාරිත්‍ර වේ.
- ජේසුස් වහන්සේගේ සාමයේ පණිවුඩය ලෝකවාසී සියලු දෙනා විසින් අගය කළ යුතු බව පිළිගැනීමට ලක් වෙයි.

## නත්තල් උත්සවය හා බැඳි නිර්මාණ

නත්තල් සීයා



සුභ පැතුම්





ගව ලෙන



නත්තල් ගස



- **ඉහත තොරතුරු ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. නත්තල් උත්සවය සමරන ආගමික ජන කොටස හා මාසය නම් කරන්න.
2. නත්තල් උත්සවය හා බැඳුණු සැරසිලි අංග 4 ක් නම් කරන්න.
3. නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණ කුමක් ද ?
4. මෙම උත්සව කාලය තුළ සිදුවන යහපත් ක්‍රියා දෙකක් නම් කරන්න.
5. නත්තල් සැරසිලි සඳහා භාවිතවන අමුද්‍රව්‍ය 05ක් නම් කරන්න
6. නත්තල් පතකට සුදුසු නිර්මාණයක් චිත්‍රණය කරන්න.